ශ්‍රී ලාංකිකයන්ට ස්විට්සර්ලන්තය සඳහා වීසා ලබාදීම ස්විස් තානාපති කාර්යාලය මගින් අත්හිටුවා ඇති බව දිවයින පුවත්පත මගින් වාර්තා කොට ඇත. කෙසේ නමුත් මෙම ප්‍රවෘත්තියේ විශ්වාසනීයත්වය තහවුරු කිරීම සඳහා කිසිදු මූලාශ්‍රයක් ලබාදී නොමැති බවද අවධාරණය කළ යුතුවේ.

මේ අතර මව්බිම පුවත්පතද මේ සම්බන්ධයෙන් පුවතක් ප්‍රකාශයට පත් කරන අතර, ඔවුන් ඒ සම්බන්ධව කොළඹ ස්විස් තානාපති කාර්යාලයෙන් විමසා, එහි ප්‍රකාශිකාවක විසින් ලබාදුන් පිළිතුර සිය පුවතට ඇතුළත් කොට ඇත.

මේ අතරවාරයේදී විදෙස් කටයුතු පිළිබඳ ස්විස් ෆෙඩරල් දෙපාර්තමේන්තුව විසින් සිය ට්විටර් ගිණුම ඔස්සේ විමසුමකට පිළිතුරු ලබාදෙමින් ප්‍රකාශ කොට සිටින්නේ, ස්විස් තානාපති කාර්යාලය වීසා අයදුම්පත්‍ර සම්බන්ධයෙන් කටයුතු කරගෙන යාම නවත්වා නොමැති බවයි

අප විසින් මීන් පෙරද යළි යළිත් පෙන්වා දී ඇත්තේ, මූලාශ්‍රයන්ගේ රහස්‍ය භාවය හෙළිදරව් කිරීමට මූලාශ්‍රය විසින් අවසර දී නොමැති අවස්ථාවක මූලාශ්‍රයේ අනන්‍යතාවය ආරක්ෂා කළ යුතු වුවත්, ප්‍රවෘත්තියක් කරුණු සඳහා මූලාශ්‍ර සඳහන් නොකිරීම සාමාන්‍ය භාවිතාව නොවිය යුතු බවයි. එසේම මූලාශ්‍ර නිසි පරිදි සඳහන් නොකිරීම ඔස්සේ, නිරවද්‍ය නොවන හෝ නොමග යවන සුළු කරුණු ජනගත කිරීමටද ඉහළ හැකියාවක් පවතින බවයි.
#mediaethicsSL #SinhalaPress #lka #Divaina #Mawbima